ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 නොවැම්බර් 19 සඳුදා
05 වෙළුම - 05 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



# ළමා ප්‍රදීපය




## දරුවනි ! නූතන තාක්ෂණික මාධ්‍ය මෙවලම් මැද අන්ධ වී අතරමං වන්න එපා !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# නවීන මාධ්‍ය මෙවලම් මැද ඔබේ හෙට දවස ?

**ආදරණීය දුවේ පුතේ...**

ලෝකය දිනෙන් දින දියුණුවට පත්වද්දී ඊටත් වඩා වැඩි වේගයකින් තාක්ෂණයද දියුණුවට පත්ව ඇත. නූතනයේ තාක්ෂණික මෙවලම් බොහෝමයකි. අපේ ළමෝද මෙම නූතන තාක්ෂණය භාවිත කරති. Twitter ( ට්විටර්) Bloger (බ්ලෝගර්) Skype (ස්කයිප්) Inter net ''ඉන්ටර්නෙට්'' (අන්තර්ජාලය) S . M . S (කෙටි පණිවිඩ) Face Book ''ෆේස්බුක්'' (මුහුණු පොත) Mobile Phone මොබයිල් ෆෝන් (ජංගම දුරකතන) C D හා D V D මෘදුකාංග ආදි නූතන තාක්ෂණික මෙවලම් අද සමාජය තුළ බොහෝ සෙයින් ව්‍යාප්තව ඇත. තාක්ෂණය, තාක්ෂණික දියුණුව වටිනා කියන දෙයකි. එනමුදු මෙහි භයානක බව නම් අපි මෙම තාක්ෂණික මෙවලම් භාවිත කරනුයේ යහපත සඳහා නොව අයහපත් දේ වෙනුවෙනි.

අද ළමෝ බොහොමයක් පරිගණකය භාවිත කරති. දැනුම සොයා යෑමට මෙමඟින් සිදුවන්නේ විශාල සේවාවකි. ඕනෑම තොරතුරක් , විනාඩි කිහිපයක් ඇතුළතදී ලබා ගැනීම සඳහා කළ යුත්තේ අන්තර්ජාලයේ සැරිසැරීම පමණකි. මේ ළඟදි දවසක දහම් පාසල් ළමුන් සඳහා වැඩමුළුවක් කිරීමට ගිය අවස්ථාවකදී ළමුන් කිහිපදෙනෙකු සමඟ දොඩමළු වීමට අවස්ථාව උදා විණි. මා ඔවුන් සමග කතාවට වැටුණි. මට දැන ගැනීමට අවශ්‍ය වුයේ අද මේ නූතන මාධ්‍ය මෙවලම් භාවිතය කෙරෙහි මොවුන් දක්වන උනන්දුව ගැනයි. ඔවුන් මා ඇසූ පැනයට ඔවුන්ගේ වචනයෙන්ම පැවසුයේ මෙවැනි පිළිතුරකි. 'අපෝ අපි නම් ''ෆේස්බුක්'' එකේ ඉන්නවා. මගේ යාළුවොත් ඉන්නවා... අපිට සෑහෙන්න ''කනෙක්ෂන්'' (සබඳතා) තියෙනවා, සෑහෙන්න යාළුවෝ පිරිසක් අපට ''සෙට් වෙලා'' (එකතුවෙලා) ඉන්නවා. අපි ඉතිං දවස ගානේ ඒ අයත් එක්ක ''චැට් කරනවා'' (කතා කරනවා)

වර්තමානයේ Face Book ජනප්‍රිය සංකල්පයක් බවට පත්ව තිබෙනවා. මෙහි විශේෂත්වය වනුයේ මෙහි පවත්නා සමාජ සම්බන්ධතා ජාලයයි. අද සමාජයේ සෑම පරාසයකම විවිධ පුද්ගලයෝ මෙහි කොටස් කරුවෝ බවට පත්ව සිටිති.

ආදර දුවේ පුතේ,, ඔබ දන්නවාද අද මේ Face Book භාවිතා කිරීම නිසා ලෝකයේ ඔබ වැනි අහිංසක මල් කැකුළු වලට සිදුව ඇතිදේ. ඔබත් මේ පිළිබඳව දැනුම්වත් වීම අත්‍යවශ්‍යයි කියලා මට හිතෙනවා. ඉන්දුනීසියාවේ වයස අවුරුදු 14 ක පාසල් දැරියක් ෆේස් බුක් නිසා අනාථ භාවයට පත් වූවා. ඇය සමඟ මිතුරු වන 24 හැවිරිදි තරුණයෙක් තම මිතුරන් සමග ඇයව උපක්‍රමශීලිව රවටාගෙන පැහැරගෙන ගොස් අතවරයකට ලක් කරනවා. ඇය පැන ඇවිත් දිවි ගලවාගත්තා. ඇගේ වේදනාව, අඳෝනාව ඇය මෙසේ සඳහන් කරනවා.

''ඔහුට අවශ්‍ය වුණා මට අලුත් ඇඳුම් අරන් දෙන්න. මගේ අධ්‍යාපන ගාස්තු ගෙවන්න එහෙම කියලා ඔහු මාව එක්කගෙන ගියේ. ඒත් සිද්ධ වුනේ හාත්පසින්ම වෙනස් දෙයක්. දැන් ඒ සියල්ල ඉවරයි. මම වෛර කරනවා මට සිදුවු දේ කිසිසේත්ම පිළිගන්න බෑ ඔවුන් මාව දූෂ්‍ය කළා තලා පොඩි කර දැම්මා'' (''දිනමිණ'' ''සමකය'' - අතිරේකය 2012.11.08 )

එසේම ෆේස්බුක් භාවිතයේ අඳුරු පැතිකඩක් විවර කරමින් කැනඩාවේ බ්‍රිටිෂ් කොලොම්බියා ප්‍රාන්තයේ 15 හැවිරිදි දැරියක වූ ''අමන්ද ටොඩ් '' පසුගිය ද සියදිවි නසා ගන්නවා. ඒ තමාට සමාජයට මුහුණු දීමට නොහැකි වූ සේයාරුවක් අන්තර්ජාලය තුළ පළකර තිබීම හේතුවෙනි

විවිධාකාරයේ මාධ්‍ය භාවිතයට වහල්වී සිටීම අපචාරයන්ට හේතු වෙනවා. ඇතැම් දුවලා පුතාලා ඉන්නවා ඔවුන්ට ජංගම දුරකතන දෙකක් තිබෙනවා. පාසල් වියේ පසුවන ළමුන්ට මේවා අවශ්‍යද? අද ජංගම දුරකතනයෙන් පවා අන්තර්ජාලයේ සැරිසැරීමට හැකියාව තිබෙනවා. තාක්ෂණය එතරම් දියුණුයි. අවාසනාවකට ළමුන්ගේ ජංගම දුරකතන තුළ තිබෙනුයේ අසභ්‍ය දසුන් , දුවේ පුතේ ඔබ අමතක කරන්න එපා ඔබ කිතුනු ළමයෙක් බැව්. ළමා ප්‍රදීපය කවරය දිහා බලන්න.

මෙහි සඳහන් වෙනවා ''නූතන තාක්ෂණික මාධ්‍ය මෙවලම් මැද අන්ධවී අතරමං වන්න එපා'' යනුවෙන්. ඔබගේ ඔය ලස්සන ජීවිතය ආයේ එන්නේ නැහැ. අද වරද්දගත්තොතින් සදකල් ඔබට හිමිවන්නේ දුකෙන් කලකිරීමෙන් දිවිය ගත කිරීමටයි. නූතනයේ මාධ්‍ය ඔබව ග්‍රහණයට හසුකරගෙන ඔබ ගිල ගැනීමට මාන බලමින් සිටිනවා. ඒ නිසාවෙන් ආදර දුවේ පුතේ, ඔබ ආගම දහම අදහමින් ඔබ සතු වටිනා ගුණාංග වර්ධනය කර ගනිමින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේව අනුගමනය කරනා සැබෑ කිතුනු දුවෙක් පුතෙක් වීමට උත්සහ කරන්න . තාක්ෂණික මෙවලම් වලට ඔබව යටපත් කරන්න ඉඩ දෙන්න එපා... බුද්ධිමත්ව කටයුතු කරන්න.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

**කුමර නයනජිත්**
ළමා ප්‍රදීපය, සහය සංස්කාරක

# කිතු දහම මන්නාරමේ පැතිර යයි.



## සිරිලක කිතුනු 09 ඉතිහාසය

අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි

දකුණු ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් අතර ඇත්තේ ඉතා සුළු දුර ප්‍රමාණයකි. මේ හේතුවෙන් දකුණු ඉන්දියාවේ කොමරින් තුඩුවේ ධීවරයන් හා අප රට මන්නාරම් වෙරළේ ධීවරයන් හා අතර කිට්ටු සම්බන්ධතා පැවැතිණි. මේ දෙපිරිස ම දෙමළ බස භාවිත කළෝ ය.

වැඩි කලක් ගත වන්නට පෙර ගරු ප්‍රැන්සිස් සාවියර් පියතුමා ගේ යහගුණ හා කීර්තිය මන්නාරමේ වැසියන් අතර ද පැතිරෙන්නට විය. මේ වන විට දිවයිනේ උතුර හෙවත් යාපනය රජ කළේ කිරීටය පැහැර ගත් දෙමළ රජෙකි. චෙකරාස සේකරන් හෙවත් සංකිලි නම් වූ මොහු මේ වන විටත් පෘතුගීසීන් සමග ගැටී සිටියේ ය.

ෆ්‍රැන්සිස් සාවියර් පියතුමා ගැන දැනගත් මන්නාරමේ ධීවර ජනතාව මෙන් ම අප බස්නාහිර වෙරළබඩ ධීවර ජනතාව ද එතුමන් මෙහි ගෙන්වා ගැනීම අපේක්ෂා කළෝ ය. ඔවුන් එකමතිකව උන්වහන්සේට පැමිණෙන ලෙස ආරාධනා කළ නමුත් පැමිණීමට නොහැකි විය. ඉන්දියාව තුළ කාර්ය බහුල වීම එහි හේතුවයි.

මෙරට ධීවර ජනතාව සාවියර්පියතුමන්ගේසිල්වත් ජීවිතය පිළිබඳවත් එතුමන් සෙසු යුරෝපා ජාතිකයින්ට හාත්පසින් වෙනස් ව ජනතා සුබසෙත සඳහා සේවා කරන පුද්ගලයකු බවත් දැනසිටි නිසා එතුමන් හැඳින්වූයේ ''සුදු සවාමියාර්'' කියා ය. ''පෙරිය පාඩ්‍රේ'' යනුවෙන් ඉන්දියානුවන් හැඳිනගත් මෙතුමන් එනතුරු මන්නාරමේ ජනතාව බලා සිටියෝ ය.

මේ අනුව ක්‍රි.ව. 1544 දී මෙන් ම 1545 දී ද ආරාධනා යවන ලදි. ඒ එසේ වුවත් එම ආරාධනය නොපිළිගත හැකි වුයේ එවකට ඉන්දියාවේ විජයනාගර්හි කතෝලික පිරිස මුහුණ දී සිටි යුද තත්ත්වයක් නිසා ය. මොවුනට මේ වන විට වඩග හමුදවන් ගෙන් නිතර නිතර ප්‍රහාර එල්ල වෙමින් පැවැතියේ ය.

මේ අවස්ථාවේ සාවියර් පියතුමාගේ අදහස වූයේ තුත්තුකුඩියේ සිටි එක්තරා මන්සිල්හාස් නමැති පියතුමකු මෙහි එවීමට යි.

මේ වන විට පුන්නෙයිකාය ලාහි සිටි සාවියර් පියතුමන් මන්සිල්හාස් පියතුමනට මේ වග දන්වා හැරියත් එතුමනට ද වඩග වදකයන් ගේ පීඩනය නිසා පැමිණීම අසීරු විය. හිංසා දිගු කලක් පැවැතීම හේතුවෙන් සාවියර් පියතුමාගේ සැලැසුම වෙනස් කරන්නට සිදුවිය.

අවසානයේ දී එක්තරා පූජක තුමකු මෙහි එවන ලදි. එතුමන්ගේ නම සාවියර් පියතුමන් ගේ ලිපි ලේඛනවල සඳහන් වී නැත. පසු කාලයේ පළ වු ලේඛන අනුව එය ගරු ජුවාන් ද ලිසානෝ නමැති පදවි පූජක තුමන් යැයි පිළිගනු ලැබේ.

මෙසේ එවන ලද පියතුමන් විසින් මන්නාරමේ ජනතාවට ප්‍රසාද ස්නාපනය දනයකොට කිතු දහමේ කුලවද්දන ලදැයි ගරු ෆ්‍රැන්සිස් සාවියර් පියතුමා ම සඳහන් කරයි.

මෙසේ විසි දහසක පිරිසක් එහි දී කතෝලික දහම වැළඳගත් බව වාර්තා වේ. මේ සියලු දෙනා මනා දහම් දැනුමක් ලද්දේ දැයි ප්‍රශ්න කළ හැකිය. එහෙත් එද පැවැති සමාජපරිසරයහාපවුල්අතර බැඳීම හේතුකොටගෙන මූලික දැනුම ලබාදුන් පසු පුද්ගලයන් තමන් ජීවත් වූ සංසය තුළ විශ්වාසයෙහි පොහොසත් කෙරිණ.

ෆ්‍රැන්සිස් සාවියර් පියතුමන් විසින් ඉන්දියාවේ ට්‍රැවන්කෝර් වෙරළබඩ පෙදෙසේ මකුවා හෙවත් මුක්කර වංස දස දහසක් දෙනා කුලවද්දන ලද්දේ ද එම බලාපොරොත්තුව ඇතිව යි.

මන්නාරමේ ජනතාව ද මූලික දැනුම ලබා කිතු දහම වැළැඳගත් බවට සැකයක් නැත. ඔවුන් ලද ඒ පදනම මත විශ්වාසය කොතරම් ශක්තිමත් වූයේ දැයි ඉදිරි ලිපියෙන් පැහැදිලි වනු ඇත.

## හලාවත පදවිය



බෝලවත්ත පරලෝක රාජේශ්වරියගේ දෙව්මැදුරේ දරුවෝ 61 දෙනෙකු පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දිව්‍ය යාගයෙන් පසු මීසම් සේවක ගරු ලක්සිරි ප්‍රනාන්දු මීසම් සහයක ගරු සුජාන් නිශ්ශංක යන පියතුමන්ලා , දහම් ගුරුවර ගුරුවරියන්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ දරුවන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සේයාරුවකට පෙනී සිටි අයුරු

**අදිතා කුමාරසිංහ.**






මීගමුව ශාන්ත ජෝශප් ශාඛා විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යවෝ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූහ. දේව මෙහෙය කඩොල්කැලේ උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දේවස්ථානයේදී පැවැත්වුණි.

''ඥානාර්ථ ප්‍රදීපය'' ප්‍රධාන කර්තෘ ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවැත්විනි. මේ අවස්ථාවට ශාන්ත ජෝශප් ශාඛා විදුහලේ අධ්‍යක්ෂ ගරු සුදත් ගුණතිලක, කඩොල්කැලේ මීසම් සේවක ගරු ලින්ටන් ජෝශප් යන පියතුමන්ලා ද එක් විය. ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ දරුවන්ගෙන් කොටසක් සේයාරුවෙහි වෙති.

**රේමන් අපොන්සු**

## කොළඹ පදවිය



කොම්පඤ්ඤවීදිය ශු. ජපමාලදේවමාතාදේවස්ථානයේ දරු දැරියන් 9 දෙනකු පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත්හ. දිව්‍ය පූජාවෙන් පසුව මීසම් සේවක ගරු හයිසින්ත් පෙරේරා, සහය මීසම් සේවක ගරු ලියොන් බබාපුල්ලේ පියතුමන් සහ ගරු ශමාන් සහෝදරතුමන් සහ දරු දැරියන් පුහුණු කළ ගරු මේරි ප්‍රියානි පැවිදි සොයුරිය සමඟ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ දරු දැරියන් සේයාරුවකට පෙනී සිටි අයුරු..

**ක්‍රිෂාන්ති පෙරේරා**

# පයාගල සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසලේ පස්වන සංවත්සරය





පයාගල සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසලේ 5 වන සංවත්සරය පසුගියදා පයාගල සා. ජෝශප් ශාලාවේදී සැමරිය. විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙයට මෙම පාසලේ නිර්මාතෘ උස්වැටකෙයියාව මීසම් සේවක ගරු අයිවන් පීටර්ස්, විශේෂ ව්‍යාපෘති පිළිබඳ නාහිමි අති ගරු අයිවන් පෙරේරා, පයාගල මීසම් සේවක ගරු නිලන්ත උඩුවක යන පියතුමන්ලා හා සුරදූතික නිකායේ ශ්‍රේෂ්ඨාධිපතිනි ගරු රේමන්ඩ් විජේසූරිය පැවදි සොයුරිය ද සහභාගි වූහ.

මෙදින ළමුන්ගේ හැකියාවන්ගෙන් උත්සවය වර්ණවත් වූ අතර ප්‍රථම වතාවට වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයක් පැවැත්විය. විදුහල්පති ගරු මේරි පෝල්, උප විදුහල්පති ගරු මේරී පිලීෂියා පැවදි සොයුරියන් හා ආචාර්ය මඩුල්ල එක්ව මෙය සංවිධානය කළහ. විශ්‍රාමික අගරදගුරු හිමිපාණන්ගෙන් සිසුවියක් ත්‍යාග ලබන අයුරු හා මෙදින ළමුන් ඉදිරිපත් කළ විශේෂාංගයක් සේයාරුවෙහි දිස්වේ.

(දිස්නා පියුමාලි)

**මාසික සිතිවිල්ල**



**මාසික සිතිවිල්ල**

"නොවැම්බර් මාසය"

ළමා ප්‍රදීපය, අංක 02,

ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

සේයා :-

ශ්‍රියංගනී පිලීෂියා

# නාගොඩ, කළුතර නවක මීසමේ දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්



නවක මීසමක් බවට පත්වී මාස 6 ක් පමණ වන නාගොඩ, කළුතර මීසමේ ශු. මිඛායෙල් අග්‍රදූත දෙව්මැදුරේ දහම් පාසලේ ඉගෙනුම ලබන ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් නොවැම්බර් 25 වන ඉරුදින දේව මෙහෙයෙන් පසුව පැවැත්වීමට කටයුතු යොදා ඇත.

දහම් පසලේ 6 වන ශ්‍රේණියේ සිට ඉහල ළමුන් සඳහා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.

**රංජිත් නෝනිස්**

# ගොඩැල්ල සුදතුම් වරම් ලබන ළමුන්ට විශේෂ වැඩමුළුවක්

ගොඩැල්ල මීසමේ අභිවෘද්ධි ආලේපය ලැබීමට සූදානම් වන දරුවන් සඳහා විශේෂ වැඩමුළුවක් මීසම් සේවක ගරු මොරිස් ඇන්ඩර්සන් පියතුමාගේ අනුශාසකත්වයෙන් සංවිධානය කෙරෙනි. ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසින් මෙහෙය වූ මෙම වැඩමුළුව ගොඩැල්ල සා. සෙබස්තියන් මුනි දෙව්මැදුරේදී ''නූතන ජන-මාධ්‍ය භාවිතය හා තාරුණ්‍යය'' යන මැයෙන් පැවැත්විණ.





පාසල් ළමුන් මෙන්ම යොවුන් පිරිස අන්තර්ජාලය හා මුහුණු පොත් ( Face Book ) නැවැරදිව භාවිත නොකිරීම නිසා සමාජයේ සිදුවන විවිධ දූෂණයන් පුළුල් ලෙස විග්‍රහ කරමින් නූතන ජන මාධ්‍යය නිවැරදිව භාවිත කරමින් ලබන දැනුමින් සමාජ මෙහෙවරක යෙදෙන ආකාරය ප්‍රබල ලෙස විග්‍රහ කරන ලදි. දරුවන්ට ලබා දුන් දැනුම සමග අභ්‍යාස ද සිදු කරමින්, විශේෂයෙන් කිතුනු දරුවන් නූතන ජනමාධ්‍යය නිවැරදිව භාවිත කළ යුත්තේ කෙසේද යන්න ගැන පුළුල් කතිකාවක් සිදු විය.

දේශක මහතා සුදතුම් වරම් ලබා ගැනීමට සූදානම් වන යෞවන දරුවන් සඳහා කළ ප්‍රථම වැඩ සටහන ද මෙය විය. ඉදිරිපත් කිරීමේ ඉතා සිත් ගන්නා බව නිසාම සම්මන්ත්‍රණය අවසානයේදී දරුවන් තුළ ප්‍රබෝධයක් ද, මහත් දැනුමක් ද ලබා ගත් බව දරුවන්ගෙන් ප්‍රකාශ විය.

ගොඩැල්ල මීසමේ තඹරවිල, මෝරුක්කුලිය, දන්කොටුව , ගොඩැල්ල දෙව්මැඳුරු වලට අයත් සුදතුම් වරම් අපේක්ෂා කරන සියළුම දූ දරුවන් මෙම අවස්ථාවට සහභාගි වූහ. මීසම් සේවක මොරිස් ඇන්ඩර්සන් පියතුමා මෙම වැඩමුළුව පැවැත්වීමේ අරමුණ පැහැදිලි කරන අයුරු දේශක කුමර නයනජිත් මහතා ළමුන් අමතන අයුරු හා සහභාගි වූ ළමුන්ගෙන් කොටසක් සේයාරුවෙහි දිස්වේ. **එච්.ඒ. සිරිල් පෙරේරා**







## පයාගල සුරදූතික බාලිකාවියෝ විශ්වාසයේ වසර ප්‍රකාශ කරති

පයාගල සුරදූතික බාලිකා අපේක්ෂා පාසලේ විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කෙරිනි. විදුහල්පතිනි ගරු මේරි පෝල් පැවදි සොයුරිය මෙම කටයුතු සූදනම් කළ අතර පයාගල මීසම් සේවක ගරු නිලන්ත උඩුවක පියතුමන් විසින් 2012-2013 විශ්වාසයේ වසර ලෙස පාසල තුළ ප්‍රකාශයට පත් කරන ලදි. පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව දැල්වූ ඉටි පහන සූදනම් කර තිබූ විශේෂිත මණ්ඩපය වෙත ගරු ගාම්භීරව ගෙන යන අයුරු ඡායාරූපයේ දැක්වේ.

**සුමුදු නිසංසලා - 9 ශ්‍රේණිය - සුරදූතික බාලිකා අපේක්ෂා පාසල - පයාගල**

# ආදි සිසුවෙකුගෙන් පාසල් මාතාවට වටිනා තිළිණයක්



නාත්තන්ඩිය ලූර්දු මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු වන සංජීව ප්‍රනාන්දු මහතා පසුගියදා රු. ලක්ෂ දෙකක් පමණ වටිනා අභ්‍යාවකාශ නිරීක්ෂණය කළ හැකි දුරේක්ෂයක් එම විද්‍යාලයට පරිත්‍යාග කරන ලදි.

එතුමන් විදෙස්ගත නිසා දෙමාපිය දෙපල විසින් විදුහල්පති චම්ලි කුරුකුලසූරිය සහ සිසු දරුවන් වෙත පරිත්‍යාග කළ අවස්ථාව මෙහි දිස්වේ. **ශ්‍රියාංගණී පිලීෂියා**

## දියලගොඩ දහම් ළමුන්ගෙන් ගුරුවරුන්ට උපහාර

දියලගොඩ සාන්ත සෙබස්තියන් දහම් පාසලේ දරු දැරියන් විසින් සංවිධානය කරන ලද ගුරු උපහාර උළෙල පසුගියදා දියලගොඩ ප්‍රාථමික විදුහලේදී පැවැත්විණි.

මීසම් සේවක ගුරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති එම උළෙලේදී දැරියන් විසින් ඉදිරිපත් කරන ලද රංගනයක් මෙහි දිස්වේ **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**



## ඉගෙනීමට හපන් සිසුවියක්



කලමුල්ල රෝමානු කතෝලික විදුහලේ **නොනිම් භාග්‍යා** ශිෂ්‍යාව පසුගිය පහේ ශිෂ්‍යත්ව විභාග යෙන් කළුතර දිස්ත්‍රික්කයෙන් වැඩිම ලකුණු (175) ලබාගත් දක්ෂයන් අතරට එක් වෙමින් තම විදුහලට කීර්තියක් අත්කර දීමට සමත් වූවාය.

බොදුනු දරුවකු වූ මෙම ශිෂ්‍යාව කතෝලික දහමේ හුරුව හා වට පිටාවේ අත්දැකීම් තම දක්ෂතාවයට මහත් රුකුලක් වූ බව පවසයි.ඇයගේ ඉදිරි ගමනට ළමා ප්‍රදීපයේ සුභ පැතුම්. ඇන්ටනි ප්‍රනාන්දු

# මීගමුව මාරිස්ටෙල්ලා ප්‍රාථමික සිසුහු කුසලතා ඔප්නංවති.

මීගමුව මාරිස්ටෙල්ලා විද්‍යාලීය ප්‍රාථමික අංශයේ සිසු දරුවන් විසින් ඉදිරිපත් කළ ''බැබළෙන තරු'' විවිධ ප්‍රසංගය පස්වන වරටත් පසුගියදා විද්‍යාලීය ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්වුණි. දර්ශනවාර දෙකකින් යුක්තවූ මෙම විවිධ ප්‍රසංගයේදී ප්‍රාථමික අංශයේ සියලුම සිසුහු කුසලතා එළිදැක්වූහ.

පොතට පමණක් සීමා වු මෙම කාලය තුළදී ළමුන් තුළ ඇති සැඟවුණු කුසලතා ඔප්නැංවීම මෙය පැවැත්වීමේ අරමුණ විය. මේ සඳහා ප්‍රාථමික අංශයේ ආචාර්ය මඩුල්ලෙන් නොමද සහයක් ලැබිණි. මෙදින ළමුන් ඉදිරිපත් කළ විශේෂාංගයක් මෙහි දිස්වේ.



✍ **විද්‍යාලීය ලේඛක හවුලේ , චතුර සෙම්බුකුට්ටිආරච්චි**

# අපේ ගෙවත්ත

ගස් වල මල් පිපිලා
අව්වට දිලිසෙනවා
එක එක මල් පිපිලා
අව්වට දිලිසෙනවා

පිච්ච මලයි - රෝස මලයි
ඕලු මලයි - ඩේලියා

ඔක්කොම මල් පිපිලා
හරිම ලස්සනයි
අපේ වත්ත - හරිම ලස්සනයි



**සඳුනි නිසංසා කුලතුංග**
2 ශ්‍රේණිය
ශා. ලෝරන්ස් කන්‍යාරාමය - වැල්ලවත්ත

# ජල සම්පත සුරකිමු



ජල සම්පත ඉතා ප්‍රයෝජනවත්ය. එය අපට වටිනා සම්පතකි එය ළිං මගින් , වර්ෂාවෙන් , ගංගා , ඇළදොළ , ජල නළ මගින් ලැබේ. ජල සම්පත නැතිව අපට ජීවත් වීමට නොහැකිය එය නාස්ති නොකර අපි ජල සම්පත සුරකිමු.



**නිර්මාල් පෙරේරා**
3 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව

# ලොකු අම්මේ



පියෙක් නැති මවක් ඇති මා
හදා වඩා ගත්තේ නුඹයි
තම ජීවිතයම කැප කරමින්
ලොව චමත්කාර කරන්නට
මා පෝෂණය කළේ නුඹයි

පෙම්බර ලොකු අම්මේ

දාරක සෙනෙහස පා සැමටම
නිතර අභියෝග ජයගනිමින්
අනාගතයට පාර කියන ඔබ
පිදුම් ලැබිය යුතු මෑණියකී,
පෙම්බර ලොකු අම්මේ,

සදාණය ගැතියි ඔබහට මා.....
''මගේ ජීවිතයේ මිණි පහන නුඹයි...''

**තිළිණි චේතනා ප්‍රසාදිනී**
12 ශ්‍රේණිය (කලා අංශය)
ව/හලා/වෙන්/දංකොටුව බාලිකා මහා විදුහල

# වැස්ස

නිල් අහස චුට්ට චුට්ට කළු පැහැ වෙනවා
ගෙම්බන් බක බක බක ගා නාද කරනවා
වැහිළිහිණියෝ ආකාසේ පියා සලනවා
ළමයින් බිය වන තරමට විදුලි කොටනවා

පොඩ්ඩ පොඩ්ඩ වැහි බිංදු වතුර වැටෙනවා
එක පාරට මහ වැස්සක් කඩා හැලෙනවා
අපේ පාරේ කානු පිරී වතුර ගලනවා
වැහිළිහිණියෝ ආකාසේ පියා සලනවා

අපේ ගමට හෝ ගාලා වැස්ස වහිනවා
සුළං හමා දස අතටම කොළ විසිරෙනවා
මහ සුළඟට ලොකු ලොකු ගස් කඩා වැටෙනවා
රෑ වාගේ දස අතටම අඳුර ගලනවා

**නිර්මාණි ඉන්දිරා වික්‍රමසිංහ**
5 ශ්‍රේණිය
යහපත් එඬේරා කන්‍යාරාමය - කොටහේන
කොළඹ 13

# අපේ දහම් පාසල

අපේ දහම් පාසල වනුයේ මොරටුව උයන සා. ජෝසප් දහම් පාසලයි. දහම් පාසලේ ඉගෙනීම ලබන අයියලා , අක්කලා , නංගිලා , මල්ලිලා බොහෝය. මම ඉගෙන ගන්නේ 3 වන පංතියේය. අපේ පංතියේ ගුරු තුමිය අපට දෙවියන් වහන්සේ ගැන මරිය තුමී ගැන විස්තර ගොඩක් කියලා දෙනවා. ඇය අපිට හොඳ ළමයෙක් වීමට උදව් කරයි.



**ශෙනායා ප්‍රනාන්දු**
3 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

# මව් සෙනෙහස

නින්ද යන විට ඔබ සිහි කෙරුවා
සිහිනෙන් ඇවිදින් හිස අතගෑවා

අම්මාගේ කරුණාව සෙනහස
නිම් හිම් නැත අපේ ලොවේ
ජීවිත නදියෙන් අප නැහැවූයේ
ඔබමයි මගේ අම්මේ

**ගවීනා දූබරේ**
6 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය - කොළඹ 07

# වරම් දෙනු මැන

ගලා යන දිය ගඟුලක් සේ
ගල් පරවල හැපි හැපී
සැලෙන හදවත් අපේ
නිතරම
පාපයෙන් පිරී
නොසැලී ඉන්නට ඔබේ
ප්‍රේමය
තුළ ගුලි වී
වර දෙනු මැන සමිඳුනි
සුදතුම්
මග එළිකර දී

දෙව් වදනින් සවිමත් වී
නිති දින
දිව බොදුනින් ජීවය ලැබ
සැම දින
විශ්වාසයේ පහන දල්වා අප හදවත් තුළ
වරම් දෙනු මැන දිවි ගත කරනට නිතිදින



**හිරුණි ස්වර්ගිකා නෝනිස්**
10 ශ්‍රේණිය
සුරදූතික බාලිකා අපේක්ෂාවේ පාසල
පයාගල

# දේදුන්න



එහා ගමෙන් මෙහා ගමට
මෙහා ගමෙන් එහා ගමට
හරි ලස්සන ඒ දණ්ඩක් දැම්මා වාගේ
අහසේ අර දේදුන්නක් කවුරුද ඇන්දේ

කහ නිල් රතු දම් පාටින්
ළං වෙන්නට බැරි ඈතින්
පුංචි අපව රවටන්නද
හැඩකර ඇන්දේ
අහස් තලේ දේදුන්නක් කවුරුද ඇන්දේ

**ඩිලුෂි අසංගා ප්‍රනාන්දු**
5 ශ්‍රේණිය
සාන්ත අන්තොනි දහම් පාසල - තොඩුවාව



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 78

## Prepositions and Places
## නිපාත පද සහ ස්ථාන

11. Namali is standing ...... the top of the stairs.
නාමලී හිටගෙන ඉන්නේ පඩිපෙළේ උඩම.

12. Namalee's sister is standing ..... the bottom of the stairs.
නාමලීගේ නංගි ඉන්නෙ පඩිපෙළේ පහල.

13. The Eiffel Tower is ...... France.
අයිෆල් කුළුණ තිබෙන්නේ ප්‍රංශයේ.

14. There is a fan ..... the ceiling. සීලිමේ ෆෑන් එකක් තියෙනවා.

15. There are many flowers ..... the garden.
වත්තේ මල් ගොඩක් තියෙනවා.

16. There is some sugar... the bottle.
බෝතලේ සීනි ටිකක් තියෙනවා.

17. Mr. Perera lives ...... this building.
මිස්ට පෙරේරා ඉන්නෙ මේ බිල්ඩිමේ.

18. His flat is ...... the 3rd floor.
ඔහුගේ නිවස තියෙන්නෙ 3 වැනි තට්ටුවේ.

19. He is sitting ..... the back row of the Church.
ඔහු පල්ලියේ පිටුපස පේළියේ ඉඳගෙන ඉන්නෙ.

20. Shanthi is standing ........ the corner of the super market building.
ශාන්ති සුපර් මාර්කට් බිල්ඩිමේ කොනට වෙලා හිටගෙන ඉන්නවා.

21. She sat...... the back of the car. ඇය කාරෙකේ පිටුපස අසුනේ වාඩිවුණා

22. Nalin is looking (a).... his face (b)...... the mirror.
නලීන් කණ්ණාඩියෙන් ඔහුගේ මුහුණ බලනවා.

23. The bank is..... the left. බැංකුව තියෙන්නේ වම් පැත්තේ

24. The hospital is..... the right. රෝහල තියෙන්නේ දකුණු පැත්තේ.

25. Basil works ...... a farm. බැසිල් වැඩකරන්නේ ෆාම් එකක.

26. There are no clouds.... the sky. අහසේ වළාකුළු නෑ

27. In srilanka we drive the left. ලංකාවේ අපි පදවන්නේ දකුණෙන්.

28. What is the highest mountain .... the world?
ලෝකයේ උසම කන්ද මොකක්ද?

29. I met Keerthi ..... my way to work.
මම වැඩට යන අතරතුරදී මට කීර්ති මුණ ගැහුණා.

30. Please write your name ..... the back of the envelope.
කරුණාකරලා ඔබේ නම ලියුම් කවරේ පිටුපස ලියන්න.

31. Henry always sits.... the back of the class.
හෙන්රි සැමවිටම වාඩිවෙන්නෙ පන්තියෙ පිටුපසට වෙන්න.

32. Don't allow the children to play ..... the street.
ළමයින්ට පාරේ සෙල්ලම් කරන්න ඉඩ දෙන්න එපා.

33. Sunila is not this photograph. සුනිලා මේ ඡායාරූපයේ නෑ.

34. As you come out of the lift, my room is ...... the left. ලිෆ්ට් එකෙන් බහිනකොටම වම් පැත්තෙ තියෙන්නෙ මගේ කාමරේ.

35. Write your name .... the top of the page.
ඔබේ නම පිටුවේ උඩින් ලියන්න.

36. I like that picture hanging. (a) ...... the wall (b) ..... the Kitchen.
කුස්සියේ බිත්තියේ තියෙන පින්තූරෙට මං කැමතියි.

37. I saw that article ..... the back page.
මම ඒ ලිපිය දැක්ක පත්තරේ පසු පිටේ.

38. There is nothing interesting ..... today's newspaper.
අද පත්තරේ කිසිම රසවත් දෙයක් නෑ.

39. There was an accident..... the crossroads today.
අද හන්දියේදී ඇක්සිඩන්ට් එකක් වෙලා තිබුණා.

40. Please stop the car....... the next hotel. I want to eat something.කාරෙක ඊළඟ හෝටලය ළඟ නවත්තන්න. මට මොනා හරි කන්න ඕනා.

**සුසිල්වත් අතිඋතුම් තෝමස් කුරේ කාදිනල් යුග පුරුෂයාණෝ**

**කර්තෘ - හෙක්ට වෙල්ගම්පල - මිළ රු 350 /=**




එකල ළමා ප්‍රදීපය , ඥානාර්ථ ප්‍රදීපයේම පිටු දෙකක්විය. හැටේ දශකය එය සංසකරණය කළ "සුදු අයියා" ඒ දවස්වල දී කාටත් රහසක් වුවත් පසු කාලයේදී කොයිකවුරුත් හඳුනා ගත්හ. ඒ හෙක්ට වෙල්ගම්පල සූරීන්ය. 1972 දී ඥානාර්ථ ප්‍රදීපය ප්‍රධාන සංස්කාරක ධුරයට පත්වූයේ, ඩී.පී කුරුකුලසූරිය ගිහි සැදැහැවතා ප්‍රදීප සංස්කාරක ධුරය දැරීමෙන් දශක දෙකකට පසුවය.

1979 දී "ද මැසෙන්ජර්" ඉංග්‍රීසි කතෝලික පුවත්පතේද ප්‍රධාන සංස්කාරක ධුරයට පත් එතුමා කතෝලික පුවත්පත් දෙකේ ප්‍රධාන සංස්කාරක ධුර එකවර දැරූ ප්‍රථම හා එකම ගිහි සැදැහැවතා වන්නේය. 1988 දක්වා මෙරට සේවය කළ ඒ මහතා පසුව ආසියා කතෝලික පුවත් සේවාවට එක්ව එහි විධායක සංස්කාරක ධුරය 2002 දක්වා දැරීය. ඉන් ඉසිඹු ලැබ දැන් ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්තයේ වෙසෙමින් මේ ග්‍රන්ථය සම්පාදනය කළේය.

✍ **ශිරාන් මෛත්‍රි විසිනි.**

දේව සේවක අති පූජ්‍ය තෝමස් බෙන්ජමින් කාදිනල් කුරේ හිමිපාණන් භාග්‍යවරයට එසවීම සඳහා සිරිලක කිතුසස්න පිඹුරුපත් සකස් කරමින් සිටින අවධියක අපේ දරු පරපුරටත් තරුණ හා වැඩිහිටි පරපුරටත් එතුමන්ව හඳුන්වා දීමට මේ අනගී වෑයමකි.




> දේව සේවක අති පූජ්‍ය තෝමස් බෙන්ජමින් කාදිනල් කුරේ හිමිපාණන් භාග්‍යවරයට එසවීම සඳහා සිරිලක කිතු සස්න පිඹුරුපත් සකස් කරමින් සිටින අවධියක අපේ දරු පරපුරටත් තරුණ හා වැඩිහිටි පරපුරටත් එතුමන්ව හඳුන්වා දීමට මේ අනගී වෑයමකි

වෙසෙසින් ලක්දිව කිතු සසුන් වංශාවලියේ සැබෑ යුග පුරුෂයාණන් කෙනකු ලෙස අවිවාදයෙන් නම් කළ හැකි කුරේ හිමි ගැන අතීතයේ පත පොත ලියැවී ඇතත් නූතන පරපුරට ඒ පොත් ලබාගැනීමේ මඟක් නැත. එක් පොතක් පමණක් මෑතදී මුද්‍රණය වී ඇතත් පාඨක සාපිපාසාව නිවාලීමට එය ප්‍රමාණවත් නොවන බැව් අතිශයෝක්තියක් නොවේ.

අතිපූජ්‍ය තෝමස් කාදිනල් කුරේ හිමිපාණන්ගේ ජීවන පුරාවත මෙරට කිතු සසුන් මග එළිපෙහෙළි කොට අනාවරණය කරන කදිම පැතිකඩක් ලෙස හඳුන්වා දීම වරදක් නොවේ. කොළඹ අගරදගුරු හිමිපාණන් ලෙස එතුමන්ගේ දුරදර්ශී ප්‍රඥාවන්ත භාවය සිහිගන්වන මතක සටහන් බොහෝ තැන්වල අදත් රැඳී පවති.

දේශීය පූජක පුහුණුව, පරිවර්තන යුගය, කිතු සසුන් පෙරැළි සමයේ රුවගුණ, ගිහි දූත සේවා නව යොමුව, තේවත්ත මහා පෙළහර , පාසල් රජයට පවරා ගැනීම , ආගම්වාද හමුවේ කිතුනු පිළිවෙළ - ධීවර සමාජ මෙහෙවර ඇතුළු පරිච්ඡේද 24 ක් පුරා අපූරු තොරතුරු සමුදයක් ඉතාමත් රසවත්ව හා හරවත්ව ඉදිරිපත් කිරීමට කතුවරයා සමත්ව සිටි.

සිය ජීවන ගමන් මගේ මතක සටහන් අලුත් කරමින්ද, කාදිනල් කුරේ හිමියන් ගැන නොඇසූ නොදැන හුන් කරුණු කාරණා මහත් ඉවසීමකින් සීරු මාරුවට ඉදිරිපත් කරන්නට දරණ වෑයම නිසා මේ ග්‍රන්ථය එක හුස්මට කියවා අවසන් කිරීමට පොළඹවයි.

20 වන සියවසේ ඉපිද මෙරට මුල්ම සිංහල අගරදගුරු කාදිනල් හිමිපාණන් ලෙස මහත්වූ යුග මෙහෙවරක් ඉටුකළ කාදිනල් කුරේ හිමි ගැන බොහෝ කරුණු කාරණා දැන කියා ගන්නට මේ ග්‍රන්ථය කදිම අත්වැලකි. ඒ වෙනුවෙන් කතුවරයා වෙත ළමා ප්‍රදීපය උණුසුම් සුබ පැතුම් පිරිනමයි.



**අපේ ආදි මව්පියෝ**
**අශිනි ප්‍රනාන්දු**
04 ශ්‍රේණිය,
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



**ශුද්ධවූ බයිබලය**
**අනන්ත ප්‍රභාෂ්වර**
09 ශ්‍රේණිය
ශු. පවුලේ දේවස්ථානය
බිබිල

## පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම, පංතිය, පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**කොක්කු රැනක්**
**රමීෂා නෙලුම් පෙරේරා**
04 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
මාරවිල



**අපේ දේව අම්මා**
**අවිශ්ක ප්‍රමුදිත ප්‍රනාන්දු**
05 ශ්‍රේණිය
සාන්ත අන්තෝනි දහම් පාසල
තොඩුවාව



**මල් මෝස්තරයක්**
**සචනි පෙරේරා**
9 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ දහම් පාසල
රාජකදළුව

**මව් සෙනෙහස**
**සඳලි ඉෂාරා**
10 ශ්‍රේණිය,
ශු. විනිප්‍රීඩා මුනිවරියගේ දහම් පාසල
කහටවිල - (හාල්දඩුවන මීසම)



**දිව බොඳුනින් සව්මත් වෙමු**
**සෙව්මිණි අහිංසා**
07 ශ්‍රේණිය
සාන්ත ජෝසප් විදුහල
මීගමුව ශාඛාව






**දයාවේ මාතාව**
**සචනි අමාෂා**
03 ශ්‍රේණිය
ශු. පවුලේ කන්‍යාරාමය - බම්බලපිටිය

# ශු. අන්ද්‍රේ මුනිතුමා



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

ජනවන්දනා වසරේ අවසාන ප්‍රධානතම සාන්තුවර මංගල්‍යය ලෙස සැලකෙන්නේ ශු. අන්ද්‍රේ අපෝස්තුළු තුමන්ගේ මංගල්‍යය වේ. මන්දයත් ජනවන්දනා වසරක් නිල වශයෙන් ආරම්භ කිරීමේ දින සකස් කරන්නේ ද මේ මංගල්‍යයට ආසන්න ඉරුදිනක විමය. කෙසේ වෙතත් ජේසු සමිඳුන් අනුගාමී වූ ප්‍රබල , ප්‍රධාන ශ්‍රාවකයන් අතුරින් මෙතුමාට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ගලීල දේශයේ බෙත්සයිදාවේ උපත ලැබූ මෙතුමා සීමෝන් පේදුරු හෙවත් ශු. සභාවේ පළමු අග්‍රශ්‍රාවකයාණන්ගේ සහෝදරයා වූවේය. වෘත්තියෙන් මෙතුමා ද ධීවරයෙකි. එනමුදු මෙසියස් වරයාණන්ගේ මග පිළියෙළ කළ ශු. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ ගෝලයකු ලෙස මුලින්ම මෙතුමා ප්‍රකට විය. ජොහාන් සුභාරංචියට අනුව ජේසුස් වහන්සේ මගවඩනා දෙස බැලූ විට ස්නාවක ජුවාම් තුමා "මෙන්න දේවාජබාලකයාණෝ "යැයි ස්වාමින් වහන්සේව පෙන්වා දුන්නේ මෙතුමාට හා තව ශ්‍රාවකයෙකුටය. ඒ අනුව ඔවුහු එතුමා පසුපස ගොස් ("රබ්බි" හෙවත් 'ගුරුදේවයිනි') යනුවෙන් එතුමා අමතා ඔබ වැඩ වසන්නේ කොතැන දැයි ඇසීය. ඊට ජේසු සමිඳුන්ගේ ප්‍රතිචාරය වූයේ "ඇවිත් බලන්න" කියාය. එතැන් සිට ඔවුන්වහන්සේගේ පසු පස යමින් පේදුරුට පළමුවෙන් ජේසු සමිඳුන් හැඳිනගත්



අන්ද්‍රේතුමා "අපට මෙසියස් වරයාණන් හමුවූහ" යැයි පැවසීය. මෙසියස් වහන්සේ යනු එදා ශතවර්ෂ ගණනාවක් තිස්සේ ජුදා ජාතිකයෝ බලාපොරොත්තුවෙන් සිටි දෙවිදාණන් විසින් ආලේප කරන ලද තැනැත් වහන්සේ විය. මුල් ශ්‍රාවකයන් සතරදෙනාට මෙතුමා ද එක් විය. සමදර්ශක සුභාරංචි වල සඳහන් ලෙසට ජේසු සමිඳාණෝ අන්ද්‍රේ තුමන්ව කැඳවා ගත්තේ බෙත්සයිදා මුහුදේ මසුන් අල්ලන විට ය. පේදුරු තුමා වෙත ස්වාමින් වහන්සේ අනාවරණය කළ පරිදි "අද සිට ඔබ මිනිසුන් දිනනු ඇත"යන දේව ප්‍රකාශනයට අවනතව අන්ද්‍රේතුමා ද සිය පවුල ද, ජීවන වෘත්තිය හැරදමා ජේසුස් සමිඳුන් පසු පස ගියෝය. ජේසු සමිඳුන්ගේ ගලීලයේ දූතික මෙහෙවර හා ප්‍රසිද්ධ දිවිය තුළ පන්දහසකට කෑම දීමේ ප්‍රාතිහාර්යයට සෘජු ලෙස සම්බන්ධ වන්නේ අන්ද්‍රේ තුමාය. පන්දහසකට අධික ජනතාවක් උන්වහන්සේගේ දේශනා අසමින් සිටිනු දැක ඔවුන්ට කෑම දෙන්නැයි ශ්‍රාවකයන්ට අණ කරද්දී , කුඩා දරුවකු අත තිබූ යව රොටි පහක් ද මසුන් දෙ දෙනෙකු ද ඇති දරුවෙක් ස්වාමින් වෙත රැගෙන එන්නේ ද අන්ද්‍රේ තුමාය ජේසු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තියට ආසන්න දිනවල ජෙරුසලමේදී නමස්කාර කරන පිණිස ඇතැම් ග්‍රීකයෝ ඔවුන් වහන්සේව සොයද්දී එම ග්‍රීකයෝ හමුවන්නේ ද අන්ද්‍රේතුමන්වය. ශුද්ධාත්ම ආගමනයෙන් පසු ජෙරුසලෙම් සභාව තුළ ප්‍රබලව උත්ථානවූ ජේසු සමිඳුන් උදෙසා සාක්ෂි දැරූ අන්ද්‍රේ අපෝස්තුළුතුමා ශුභාරංචිය දේශනා කරනු පිණිස මුලින්ම පලස්තීනය, සුළු ආසියාතික ප්‍රදේශ ඔස්සේ අවසානයේ ග්‍රීසියට ගියේය. පසුව මෙතුමා තම මධ්‍යස්ථානය ලෙස පත්කරගත්තේ ග්‍රීසියයි. කල්යත් ම අපෝස්තුළුවරුන්ගේ දේශනා ව්‍යාපාරය නිසාම ග්‍රීසියේ බහුතරයක් කිතුදහම වැළැඳ ගන්නට වූ හෙයින් එකල එහි වූ විසු පාලක තන්ත්‍රයට එය මහත් අභියෝගයක් විය. මේ නිසා ම කිතුනු හිංසා කාලපරිච්ඡේදයක් ආරම්භ කළ අතර ක්‍රි.ව. 60 දී පැට්‍රාස් හි දී X හැඩයේ එනම් කතිර හැඩයක වූ කුරුසියක එල්ලා මෙතුමන්ව මරා දමන ලදි. අදත් මෙතුමාගේ ශු. ධාතු කොන්ස්තන්තිනෝපල් නගරයේ දක්නට ඇත. මෙතුමාගේ මංගල්‍යය උත්සවශ්‍රීයෙන් නොවැම්බර් 30 වන දින සැමරේ තවද කතෝලික සභාව හැරුනු කොට පෙරදිග සභාවන්ද, ඕර්තඩොක්ස් සභාවන් ද, දකුණු ඉන්දිය සභාවන්ද, එංගලන්ත හා ලූතර්වාදි සභාවන්ගේ ද ගෞරවා දරයට පත්වූ ප්‍රබල අපෝස්තුළුවරයකු ලෙස මෙතුමාව නම් කළ හැකිය

**අසේල දසනායක**

## ප්‍රහේළිකා අංක 34



සැකසුම

තිළිණි දුතිකා පෙරේරා

**හරහට**

1. මෝසෙස්ගේ මරණයෙන් පසු ඊශ්‍රායෙල් ජනතාවගේ නායකයා වශයෙන් පත්වුයේ මොහුය.

3. ක්‍රිස්තුන් වහන්සෙ, මනස්ථාපනය නොවු නගරවල වැසියන්ට කථා කරමින් ''දේව විනිශ්චය දවසේදී ඔබට වඩා .................... හා සිදොනයට සහනය ලැබෙන්නේ යැයි'' වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

4. ක්‍රිස්තුස් වහන්සේ බොහෝ අවස්ථාවල මෙය කඩ කළ බවට විනධරයන් හා පරිසිවරු ක්‍රිස්තුන් වහන්සේට චෝදනා කළෝය

5. ''මගේ වියගහ කරට ගෙන මගෙන් ඉගෙන ගන්න'' එවිට ඔබට ............ ලැබෙනු ඇති'යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

7. දොළොස් වසරක් මහලේ රෝගයෙන් පෙළුනු ස්ත්‍රියක් ක්‍රිස්තුන් වහන්සේගෙන් සුවය ලබාගත්තේ මහත් විශ්වාසයකින් යුතුව මෙය ස්පර්ශ කිරීමෙනි.

**පහළට**

1. දේව මෑණියන්ගේ පියාගේ නම

2. ''මගේ පියාණන් වහන්සේගේ නිවාසයෙහි බොහෝ .......... ඇතැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ශු. බයිබලයේ නව ගිවිසුමෙහි ශු. පාවුළු තුමා විසින් යවනු ලැබු හසුන් පත්වලින් එකකි.

5. තමන්ට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙම වාර ගණන දක්වා පමණ දැයි පේදුරු තුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළේය.

6. යක්ෂයා , ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින් ලෝනයේ සියල් රට රාජ්‍යයන් පෙන්වා මේවා කෙරෙහි මුළු ආදිපත්‍යයද ඒවායේ........ ඉසුරුද ලබා ගැනීමට නම් යක්ෂයාට නමස්කාර කරන ලෙස ඉල්ලීය. මෙහි හිස්තැනට සුදුසු වචනය

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. මතෙව් 11/18, ශු. ලුක් 4,8,9,6 , ශු. ජුවාම් 14,)

# කැපවීම




මම අද ඔයාලට කියන්න යන්නේ අපි හොඳින් දන්නා එහෙත් ඒ ගැන හිතන්නේ නැති නිසාමදෝ අද අපේ දරුවන් තුළින් ක්ෂය වෙමින් පවතින දෙයක් ගැනයි.

ඒ තමයි ''කැපවීම''

ආදර දුවේ, පුතේ, අපිට පුළුවන් නම් ඕනම දෙයකට කැපවෙන්න, ඒ දේ අතිසාර්ථක ලෙස නිමාකරන්න අපිට පුළුවන්. පුංචි ඔයගොල්ලන් තුළත් මේ කැපවීම තියනවාද, චුට්ටක් හිතලා බලන්න. මම හිතන හැටියට නම්, පුංචි ඔයගොල්ලන් ලඟ කැපවීම තියෙනවා. ඒත් ප්‍රශ්නය නම් එම කැපවීම ක්‍රියාකාරි නොවීමයි.

පුංචි ඔයගොල්ලෝ ආශා කරන ක්‍රීඩාවක් කරනකොට ඔයාලා ඒ දේට කැපවෙනවා.. එතකොට ඔයාලා ජයගන්නවා. ඉතින් මේ ජයග්‍රහණය ලබන්නේ ඔයාලගේ කැපවීම නිසා නේද?

එහෙමනම් අධ්‍යාපනයත් ඒ වගේමය. ඉගෙන ගන්න ඔයාලා ආස වුණොත් ඔයාලට පුළුවන් ඒ වෙනුවෙන් කැපවෙන්න. ආසාවයි, උනන්දුවයි, උවමනාවයි තියෙනවා නම් අන්න එතන කැපවීම ගොඩනැගෙනවා. සමහර විට සමහර දේවල් වලට ඔයාලා දන්නෙත් නැතිව කැපවෙලා. ඒ මං සඳහන් කරපු ආසාව, උනන්දුව, උවමනාව, ඔයාලා ලඟ තිබුණ නිසා. ඉතින් දුවේ, පුතේ අපේ ජීවිතයේ අපට විවිධාකාරවු කැපවීම් කරන්න සිදුවෙනවා. මේ අතරින් අපට පුළුවන් නම් දෙවිදුන් වෙනුවෙන් කැපවෙන්න , දෙවිදුන් වෙනුවෙන් සේවය කරන්න. උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන ලෙස ජීවත් වන්න.

ඉතින් පුංචි ඔයා ගොල්ලන්ට පුළුවන් අද පටන් සිතින් අදිටන් කර ගන්න දෙවිදුන් වෙනුවෙන් කැපවෙන බවට. යහපත වෙනුවෙන් කැපවෙන බවට, සත්‍ය වෙනුවෙන් කැපවෙන බවට. එතකොට ඔයාලට පුළුවන් ලස්සන පුංචි සමාජයක් ගොඩනගන්න. එවිට ඔයාලට පුළුවන් දෙවියන්ගේ ආශිර්වාදයත් ලබා ගනිමින් යහපත් ළමා පරපුරක් ලෙස ගොඩනැගෙන්න.

ලක්මිණි ප්‍රනාන්දුපුල්ලේ ගුරු මව

( තෝප්පුව දහම් පාසල )

**ආදර දුවේ පුතේ, සාමාන්‍ය පෙළ කතෝලික ධර්මය විෂයට සුදනම් වන ඔබට පෙරහුරු ප්‍රශ්න පත්‍ර ලබන සතියේ සිට ළමා ප්‍රදීපයෙහි පළ කෙරේ.**

**සංස්කාරක පියතුමා**


රජ කුමාරයයි කිඳුරු කුමාරියයි
කථාව:- ආනන්ද කාල්දේරා
දෙබස්, චිත්‍ර:- ඇස්. ඒ. පී. සපුආරච්චි
23
මට මගෙ රාජ කුමාරයා බලන්න යන්නම ඕනි... චිදු එයාව මූද මැද්දෙ පුංචි මාළිගාවක් හදල ඒකෙ තනි කරල ආව.. ආවමයි.. මට එයාව... දකින්නවත් නැතිවුනා....
දවස් ගණන් සති ගණන් මෙහෙම කාලය ගතවෙනකොට රැජිණට කුමාරිගැන කිසිම සැක යක් නැතිවුනා කුමාරිට මුහුද උඩට ඇවිල්ල කුමාරයව බලන්න යන්න හිතුනා...
මේ ගමන නම් කුමාරයව බලන්න යන්නම ඕනි.. මගෙ යාළුව හම්බවෙන්න ඕනි..
ඊට පස්සෙ එයාගෙ යාළු කිඳුරිව හමුවෙලා ඒ බව කිව්වා...
අනේ අපි අදම යමු මගෙ කුමාරයව ...බලන්න..
එහෙනම් අපි කාටත් හොරා අද රෑටම මේ ගමන පිටත්වෙමු...
චිදු කරුවල වැටීගෙන එන කොටම මේ දෙන්න ගමනට පිටත් වුනා...
කුමාරයා සිටින.. මුහුද මැද මාළිගාව ළඟට එනකොට සැඳහෙන වේලාවක් ගතවුනා...
ඒතන හරියට සැණකෙළියක් වගෙයි.. ලස්සන රත්තරං මාළු සින්දු කියනවා.. හැම තැනම පාට පාට එළිවමින්... ...බැබළිනා.
මේව දැකල මේ දෙන්නට හරියට පුදුම හිතුනා...
ඕ... හරි පුදුමයි

ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ කතාව

# අසීසි නගරයේ දිළින්දා

01




